චක්‍රලේඛ අංකය: 01/2021
මගේ අංකය: MOJ/AC/22/20
අධිකරණ අමාත්‍යාංශය
කොළඹ 12
2021.03. 08

සියලුම මහාධිකරණ විනිසුරුවරුන් / දිසා විනිසුරුවරුන් / මහේස්ත්‍රාත්වරුන්,

<u>රාජසන්තක කරන ලද වැලි සහ දැව බැහැර කිරිම.</u>

අංක අමප /21/0238/330/014 දරන 2021 පෙබරවාරි මස 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජසන්තක කරන ලද වැලි හා දැව බැහැර කිරීමේදී 2021.03.15 දින සිට 2024.12.31 දින දක්වා පහත උපදෙස් අනුගමනය කල යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

02. රාජසන්තක කරන ලද වැලි හා දැව පූජනීය ස්ථාන වලට සහන මිලට ලබා දිය හැකි අතර රාජසන්තක කරන ලද වැලි අදාල අධිකරණ මඟින්ද, රාජසන්තක කරන ලද දැව, රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත ලබාදීමෙන් අනතුරුව රාජ්‍ය දැව සංස්ථාව මඟින්ද ලබා දිය යුතු වේ. එබැවින් දැව රාජසන්තක කළ වහාම රාජ්‍ය දැව සංස්ථාව වෙත ලබා දීමට අධිකරණ විසින් කටයුතු කළ යුතුය.

03. පූජනීය ස්ථාන වල වැලි හා දැව සම්බන්ධ ඉල්ලීම් අදාල ඉදිකිරිම සිදු කරන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය සහිතව ආගමික කටයුතු විෂය භාර අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු අතර, එම අමාත්‍යාංශය විසින් තම නිර්දේශය සහිතව එකී ඉල්ලීම ප්‍රමුඛතා අනුපිළිවලින් කටයුතු කිරිමට අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

04. (i) ඉහත ආකාරයට වැලි හා දැව ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීම් ඇමුණුම් (01) සහ (02) ආකෘති පත්‍ර අනුව ඉදිරිපත් කල යුතු වේ. එම ආකෘති පත්‍ර අධිකරණ අමාත්‍යාංශයේ www.moj.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

(ii) මෙම අමාත්‍යාංශය මඟින් අනුමැතිය දීමෙන් පසු එකී ඉල්ලීම ඉදිරි කටයුතු සඳහා අදාළ අධිකරණ වෙත හෝ රාජ්‍ය දැව සංස්ථාව වෙත යොමු කෙරෙනු ඇත.

(iii) එසේම මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී දින 90 ක් ඇතුළත රාජසන්තක කරන ලද වැලි පූජනීය ස්ථාන විසින් අදාළ අධිකරණයෙන් ලබා ගත යුතු අතර, රාජසන්තක කරන ලද දැව අනුමැතිය ලැබී දින 180 ක කාලයක් ඇතුළත ලබා ගත යුතුය. කෙසේ වුවද මෙම සියලු අනුමැතින් 2024.12.31 දිනෙන් අවලංගු වනු ඇත.

05. (i) පූජනීය ස්ථාන සඳහා රාජසන්තක කරන ලද වැලි ලබා දීමේදී බස්නාහිර පළාත තුල වැලි කියුබ් 01 ක් රු. 2,500/- ක් සහ අනෙකුත් පළාත් තුළ වැලි කියුබ් 01ක් රු. 1,500/- ක සහන මිලක් යටතේ ලබා දිය යුතුය.

(ii) පූජනීය ස්ථාන සඳහා රාජසන්තක කරන ලද දැව ලබා දීමේදී දිස්ත්‍රික් මිල කමිටු විසින් නියම කරන ලද මිලෙන් 50% ක සහන මිලට ලබා දිය යුතු අතර, එය රාජ්‍ය දැව සංස්ථාව මඟින් ඉටු කරනු ඇත.

06. (i) ඉහත ආකාරයට සහන මිලට වැලි හා දැව නිකුත් කිරීමේදී පූජනීය ස්ථානයක් ඉදිකිරීම සඳහා නිකුත් කල හැකි උපරිම සීමාවන් පහත පරිදි වේ.

උපරිම වැලි ප්‍රමාණය - වර්ෂයකට වැලි කියුබ 10
උපරිම දැව ප්‍රමාණය - වර්ෂයකට දැව කියුබික් අඩි 100

(ii) ඊට වැඩි වන සෑම වැලි කියුබ 01ක් හා සෑම දැව කියුබික් අඩියක්ම එකී ද්‍රව්‍ය වෙන්දේසියක් පවත්වන අවස්ථාවන්හිදී වෙන්දේසියෙන් තීරණය වන මිලට ලබා දිය යුතුය.

(iii) ඒ අනුව වැලි ලබා ගැනීමේදී අදාල අධිකරණය වෙත ද, දැව ලබා ගැනීමේ දී රාජ්‍ය දැව සංස්ථාව වෙත ද ගෙවීම් කල යුතුය.

07. රාජසන්තක කරන ලද වැලි ගොඩ ගසා ඇති ස්ථානයේ සිට පිටතට ප්‍රවාහනය කිරීමේ දී වැලි ලබා ගන්නා පාර්ශ්වය විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයට නියමිත ගාස්තු ගෙවා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතුය.

08. රාජසන්තක කරන ලද දැව සහන මිලට ලබා දීමේ දී හා වෙන්දේසි කිරීමේ දී රාජ්‍ය දැව සංස්ථා චක්‍රලේඛවල සඳහන් විධිවිධාන එම සංස්ථාව විසින් අනුගමනය කරනු ඇත.

09. අදාල කාල සීමාව තුල පූජනීය ස්ථාන වෙත ලබා දී ඉතිරි වන වැලි අදාල අධිකරණය මගින් ද, දැව රාජ්‍ය දැව සංස්ථාව මගින් ද, සෑම මාස 06 කට වරක්ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය.

10. ඉහත ආකාරයට ලබා දුන් වැලි පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාළ අධිකරණ මගින් ද, දැව පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාළ අධිකරණ වලට ද පිටපත් සහිතව රාජ්‍ය දැව සංස්ථාව මගින් ද, සෑම මාස 3 කට වරක්ම මෙම අමාත්‍යාංශය වෙත යොමු කල යුතුය.

**එම්. එම්.පී. මායාදුන්නෙ**
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම් - බුද්ධ ශාසන, හා ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
2. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - තම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
3. ලේකම් - අධිකරණ සේවා කොමිෂන් සභාව - අ.ක.ස
4. සාමාන්‍යාධිකාරි - රාජ්‍ය දැව සංස්ථාව - අ.ක.ස, 08 ඡේදය කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමි.
5. අධ්‍යක්ෂ ජනරාල් - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - අ.ක.ස